# ප්‍රත්‍යක්ෂ හා ප්‍රවාද

බටහිර විද්‍යාවේත් එයට පළල්ව ගත්කල බටහිර දැනුමේත් මුලෙහි ම ඇති ප්‍රශ්නයක් වෙයි. එහි අපෙන් තොරව, එනම් නිරීක්ෂකයාගෙන් තොරව ලෝකයක් පවතින බව විශ්වාස කෙරෙයි. ඒ ලෝකය යථාර්ථය වෙයි. බටහිර දැනුම පිළිබඳ දර්ශනයට අනුව මේ ඊනියා යථාර්ථය දැනගත හැකි ය. එය දැන ගැනීමේ දී මිනිසාට ප්‍රපංචවලින් පටන්ගැනීමට සිදුවේ යැයි නොයෙකුත් වර්ගවල දාර්ශනිකයෝ අපට කියා දෙති. එහෙත් ප්‍රශ්නයක් වෙයි. මේ ප්‍රපංච සත්‍ය යැයි බටහිරයෝ නොපිළිගනිති. ඔවුන්ට අනුව අප ප්‍රපංචවලින් පටන්ගත්ත ද ප්‍රපංචවල නිරපේක්ෂතාවය හා සත්‍යතාවය පිළිබඳ ප්‍රශ්න ඇති වෙයි. ප්‍රධාන ම ප්‍රශ්නය වනුයේ මේ ප්‍රපංචවල සත්‍යාසත්‍ය බව දැනගන්නේ කෙසේ ද යන්න ය. ප්‍රපංච ඉන්ද්‍රියගෝචර බැවින් හා ඉන්ද්‍රිය පිළිබඳ සැකයකින් තොරව විශ්වාසය පළකළ නොහැකි බැවින් සත්‍යය දැනගත හැක්කේ වියුක්ත ප්‍රවාද, එනම් ඉන්ද්‍රියගෝචර නොවන ප්‍රවාද, මගින් පමණක් යැයි බටහිර ඇතැම් ඥානවිභාග මගින් කියැවෙයි. එනම් ඒ අනුව ඉන්ද්‍රියගෝචර ප්‍රපංචවලින් ඔබ්බෙහි වූ යථාර්ථය වියුක්ත වෙයි. එහෙත් යථාර්ථය පිළිබඳ දැනුම ආරම්භ වන්නේ ප්‍රපංච මගින් යැයි පැවසීමට මේ දාර්ශනිකයන්ට සිදු වී ඇත. එපමණක් නොවේ. වියුක්ත ප්‍රවාදයක් සත්‍ය වේද නැත්ද යන්න තීරණය කිරීමට සිදු වන්නේ ද අවසානයේ දී ප්‍රවාදයෙන් ලබාගන්නා නිගමන නිරීක්ෂණය කෙරෙන දෑ සමග සංගත වන්නේ දැයි පරීක්ෂා කිරීමෙනි. වෙනත් වචනවලින් කිවහොත් අවසානයේ දී ප්‍රවාදයේ නිගමන ඉන්ද්‍රියගෝචර ප්‍රපංච සමග සංගත වන්නේ දැයි සොයා බැලීමට සිදුවෙයි. ඉන්ද්‍රියගෝචර ප්‍රපංච ගැන විශ්වාසයක් නැති වුව ද දැනුම ආරම්භයේ දී ඒ ප්‍රපංච අවශ්‍ය වනවා පමණක් නොව අවසානයේ දී වියුක්ත ප්‍රවාදයේ සත්‍යාසත්‍ය බව පරීක්ෂාකිරීමට ද ප්‍රපංච අවශ්‍ය වෙයි. මේ නම් හතර බීරි කතාවකි.

බටහිර යථානුභූතවාදීන්ට හෙවත් ඉන්ද්‍රියානුභූතවාදීන්ට (positivists) අනුව විශ්වාසය තැබිය හැක්කේ ඉන්ද්‍රියගෝචර ප්‍රපංච කෙරෙහි පමණකි. ඔවුන්ට අනුව අප අත් විඳින්නේ, ප්‍රත්‍යක්ෂ කරන්නේ ප්‍රපංච පමණ ය. වියුක්ත ප්‍රවාද යනු මිනිසාගේ නිර්මාණ වෙයි. මේ ප්‍රවාද ගැන විශ්වාසයක් තැබිය නොහැකි ය. ඉන්ද්‍රියානුභූවාදයේ පුරෝගාමියකු වූ අර්නස්ට් මාක් නම් පඬිවරයාට අනුව නිව්ටෝනීය නිරපේක්ෂ අවකාශය නිරීක්ෂණය කළ නොහැකි කල්පිතයක් පමණක් විය. එපමණක් නොවේ . ඔහු කියා සිටියේ භෞතික විද්‍යාවේ ප්‍රවාදවල නිරීක්ෂණය කළ නොහැකි සංකල්ප නොතිබිය යුතු බව ය.

සාමාන්‍යයෙන් බටහිර විද්‍යාඥයෝ පළමු මතයට වැඩි කැමැත්තක් දක්වති. ඔවුහු යථාර්ථයක් ගැන විශ්වාස කරති. ඔවුන්ට සාමාන්‍යයෙන් යථාර්ථවාදීන් (realists) යැයි කියනු ලැබෙයි. අයින්ස්ටයින් විද්වතා ඉතා දැඩි යථාර්ථවාදියෙක් විය. ක්වොන්ටම් භෞතිකවිද්‍යාව පිළිබඳ කෝපන්හේගන් විවරණය සැපයූ නීල් බෝර් පඬිවරයා ඇතුළු පිරිස ඉන්ද්‍රියානුභූතවාදීහු වූහ. ඔවුහු ඉන්ද්‍රියගෝචර ප්‍රත්‍යක්ෂවලින් ඔබ්බෙහි වූ යථාර්ථයක්, සත්‍යයක් ගැන කතා කිරීම නිෂ්ඵල වුවක් යැයි කීවෝ ය. පසුගිය සියවසේ අවුරුදු හැත්තෑවක පමණ කාලයක් තුළ බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි දර්ශනය වූයේ මේ ඉන්ද්‍රියානුභූතවාදය හෙවත් යථානුභූතවාදයයි. එහෙත් දැනට වසර කිහිපයක පමණ සිට බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාව නැවතත් යථාර්ථවාදය කරා පා නගමින් සිටියි. එහි පුදුම වීමට දෙයක් නැත. බටහිර විද්‍යාවේ පමණක් නොව මුළු මහත් බටහිර දැනුමේ ම දර්ශනය යථානුභූතවාදය නොව යථාර්ථවාදයයි.

සිංහල බෞද්ධයන් මේ පිළිබඳ දරණ ආකල්පය කුමක් ද යන්න සාකච්ඡා කිරීම අපට වැදගත් වෙයි. අප විශ්වාසය තැබිය යුත්තේ ඉන්ද්‍රියගෝචර ප්‍රත්‍යක්ෂ කෙරෙහි ද? නැත්නම් වියුක්ත යථාර්ථයක් කෙරෙහි ද? බුදුන්වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන් යම් යම් දෑ දැනගැනීමට වදාළහ. වියුක්ත යථාර්ථයක් ගැන උන්වහන්සේ නොදෙසූහ. බුදු දහමෙහි වියුක්ත ප්‍රවාද නැත. ප්‍රාග් වෛදික චින්තනයෙහි වියුක්ත ප්‍රවාද නැත. බුදු දහම ද ප්‍රාග් වෛදික චින්තනයක බිහි වුවකි. වියුක්ත ප්‍රවාද වෛදික චින්තනයෙහි බිහි වූ බව කලින් සඳහන් වී ඇත. වෛදික චින්තනය යන්නෙන් අදහස් කරන්නේ ආර්ය සංස්කෘතිය භාරතයට ගෙන ඒමෙන් පසු ආර්ය සංස්කෘතියට පදනම් වූ චින්තනයත් එයට පෙර භාරතයේ පැවති චින්තනයත් මිශ්‍ර වීමෙන් ඇති වූ චින්තනය ය. මේ චින්තනය මත පදනම් වූ සංස්කෘතියට වෛදික සංස්කෘතිය යැයි ද සංස්කෘතික කණ්ඩායමක් ලෙස ආර්යයන් පැමිණීමට පෙර භාරතයේ තිබූ සංස්කෘතියට ප්‍රාග් වෛදික සංස්කෘතිය යැයි ද කියමු.

© Prof. Nalin De Silva

භාරතයේ වෛදික සංස්කෘතිය බටහිර සිට නැගෙනහිරටත් උතුරේ සිට දකුණටත් පැතිර යෑමට අවුරුදු දහසකට වඩා ගතවන්නට ඇත. භාරතයේ නැගෙනහිර සිදුහත් කුමරු ඉපදෙන සමයෙහි පැවති සංස්කෘතියට හා චින්තනයට අර්ධ වෛදික සංස්කෘතියක් හා අර්ධ වෛදික චින්තනයක් යැයි කිව හැකි වන්නේ ඒ වන විට වෛදික සංස්කෘතිය හා වෛදික චින්තනය නැගෙනහිරට මුළුමනින් ම ව්‍යාප්ත වී නොතිබීම හේතුවෙනි. විජය රජුගෙන් සංකේතවත් වන ලංකාවට භාරතයෙන් පැමිණි පිරිස භාරතයේ නැගෙනහිර විසූවෝ වෙති. එබැවින් ඔවුන් අර්ධ වෛදිකයන් වී යැයි සිතිය හැකි ය. අර්ධ වෛදිකයන් ලෙස ඔවුන්ගේ චින්තනය එතරම් වියුක්ත නොවී ය. වෛදික චින්තනය ග්‍රීක් යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තරම් වියුක්ත නොවුව ද එහි වියුක්ත ප්‍රවාද ගොඩ නැගුණු බව කලින් සඳහන් වී ඇත. ආයුර්වේදය, ජ්‍යොතිෂය, භාරතීය ගණිතය ආදිය මෙන් ම විවිධාකාර භාරතීය දර්ශන හා භාරතීය සංගීතය ද පැන නැගුණේ මේ චින්තනයෙහි ය.

ලංකාවට පැමිණි අර්ධ වෛදිකයෝ මෙරට සිටි ප්‍රාග් වෛදික යක්ෂ නාග ආදී ගෝත්‍ර සමග මිශ්‍ර වී සිංහල ජාතිය ගොඩ නැගූහ. මේ මිශ්‍රණයේ චින්තනය භාරතයේ වෛදික චින්තනය තරම් වියුක්ත නොවී ය. සිංහලයෝ ආරම්භයේ සිට ම වියුක්ත චින්තනයකට හිමිකම නොකීහ. බුදු දහම මෙරටට හඳුන්වා දීමෙන් පසුව මෙරට චින්තනයේ යම් වියුක්ත බවක් තිබිණි නම් එය අඩු වන්නට ඇතිවාක් මෙන් ම, එකී චින්තනය එතරම් වියුක්ත නොවන චින්තනයක් නිසා මෙරට බුදු දහම මුල් අල්ලාගන්නට ද ඇත. වියුක්ත චින්තනයක් තිබූ භාරතයේ බුදු දහම මුල් අල්ලා නොගත්තේ ය. එහි නගරවලට සීමා වූ බුදු සසුන පැවතියේ රාජ්‍යානුග්‍රහයෙන් හා වෙළෙඳ සිටු කුලවල අනුග්‍රහයෙනි. රාජ්‍යානුග්‍රහය නැති වූ විගස භාරතයෙහි බුදු සසුන නැති වුව ද ලංකාවේ එසේ නොවී ය. මෙරට මුහුදුබඩ පෙදෙස්වල බුදු දහම රාජ්‍යානුග්‍රහයක් නැතිව දැනට අවුරුදු පන්සියයක පමණ කාලයක් මුළුල්ලෙහි පැවතී ඇත. කන්ද උඩරට රාජධානියට අයත් ව තිබූ පෙදෙස්වල ද රාජ්‍යානුග්‍රහයක් නැතිව අවුරුදු දෙසීයකට ආසන්න කාලයක් තිස්සේ බුදු සසුන පැවතෙයි.

සිංහල බෞද්ධයන්ට වියුක්ත චින්තනයක් නොමැති බැවින් ඔවුහු වියුක්ත ප්‍රවාද ගොඩ නොනැගූහ. ඔවුහු ඉන්ද්‍රියගෝචර ප්‍රපංචවලට ඔබ්බෙන් වූ ඊනියා යථාර්ථයක් නොපිළිගනිති. අද ඊනියා යථාර්ථයක් ගැන දොඩවන සිංහලයෝ බටහිර පාසල් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමෙන් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මතුපිටින් වැළඳගත්තෝ වෙති. ඔවුහු ආගමින් කෙසේ වෙතත් සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානිහු වෙති. ඔවුන් මේ සංස්කෘතිය වැලඳගෙන ඇත්තේ මතුපිටින් පමණක් වීම නිසා ඔවුන්ට ඒ සංස්කෘතියෙහි නිර්මාණ කළ හැකි නොවේ.  එමෙන් ම ඔවුන් සිංහල සංස්කෘතියට ඇතැම්විට ගරහමින් සිංහල සංස්කෘතියෙන් වෙන් වී ඇති බැවින් ඔවුන්ට අපේ සංස්කෘතියෙහි ද නිර්මාණ කළ නොහැකි ය. දෙලොවට ම අයත් නැති ගන්ධබ්බයන් වූ මොවුන්ට කළ හැක්කේ අනුකරණය හා අනුකරණය ම පමණකි. මේ ඇංකරයෝ තම ස්වාමීන් පසුපස යමින් සිංහලයන් “ශිෂ්ට” කිරීමට උත්සාහ කරති. මේ පරපුටු පරපුරේ නූතන පුරුක පශ්චාත්නූතනවාදීන්ගෙන් සමන්විත වෙයි.

වියුක්ත ප්‍රවාද නැති සිංහල බෞද්ධයෝ ප්‍රත්‍යක්ෂ ගැන විශ්වාස කරත් ද? බුදු දහමට අනුව ප්‍රත්‍යක්ෂ, එසේත් නැත්නම් ප්‍රපංච, සංසිද්ධි (phenomena) ආදියෙන් හඳුන්වනු ලබන දෑ ගැන කිව හැක්කේ කුමක් ද? අපට ප්‍රත්‍යක්ෂවලින් තොරව ජීවත්විය නොහැකි බව පැහැදිලි ය. එහෙත් ඉන් කියැවෙන්නේ ප්‍රත්‍යක්ෂ යනු සත්‍යය වන බව නොවේ. ප්‍රපංචයක් යනු කුමක් ද? අප ප්‍රපංචයක් ද දැනගන්නේ මනසිනි. පොල් ගෙඩියක් වැටීම යන ප්‍රපංචයෙහි පොල්, ගෙඩිය හා වැටීම යන සංකල්ප වෙයි. මේ සියල්ල පංචේන්ද්‍රියන් ඇසුරෙන් ලබා ගන්නා අත්දැකීම් වෙයි. එහෙත් ඒ පංචේන්ද්‍රියන්ගේ නොයෙකුත් අඩුපාඩුකම් ඇති බව අපි දනිමු. පොල් ගෙඩියෙහි සියළු ගන්ධ අපට නොදැනෙනවා විය හැකි ය. බල්ලන්ට දැනෙන ගන්ධ අපට නොදැනෙන බව අපි දනිමු. පංචේන්ද්‍රිය අප මුළා කරයි. මිරිගුව විසින් අප රවටනු ලැබෙයි. මිරිගුව යනු ජලාශයක් නොවන බව අපි දැනගනිමු. ජලාශය යනු ජලාශයක් බව අප දන්නේ කෙසේ ද?

පංචේන්ද්‍රියන් ඇසුරෙන් ලබාගත්ත ද මේ ප්‍රපංච සියල්ල අවසානයේ දී මනසේ නිර්මාණ වෙයි. අපට මනස ගැන විශ්වාසයක් තිබිය හැකි ද? මනස යනු කුමක් ද? ප්‍රංශ ජාතික දාර්ශනිකයකු වූ දෙකාතේ පඬිවරයාගේ “මම සිතමි. එබැවින් මම වෙමි”( I think therefore I am)  යන සුප්‍රසිද්ධ ප්‍රකාශය අනුව මම වෙමි යැයි නිගමනය කෙරෙන්නේ සිතන බැවිනි. එහෙත් සිතීම ම මායාවක් නම් එවිට කුමක් සිදු වේ ද? අපට කිව හැක්කේ මම වෙමි

© Prof. Nalin De Silva

යන්න ද බොරුවක් බව ය. අඩුම තරමින් ඒ ඔස්සේ අපට මම වෙමි යන නිගමනයට පැමිණීමට නොහැකි වෙයි. මම යනු අන් කිසිවක් නොව ආත්මය වෙයි. සිංහල බෞද්ධයෝ ආත්මවාදීහු නොවෙති. ආත්මයක් ඇතැයි යන්න, මම යනුවෙන් කිසිවකු ඇත යන්න, අපේ ප්‍රත්‍යක්‍ෂය වෙයි.

එහෙත් ඒ ප්‍රත්‍යක්‍ෂය වැරදි යැයි බුදු දහම උගන්වයි. එසේ නම් ප්‍රත්‍යක්‍ෂ ගැන අපට විශ්වාසයක් තැබිය හැකි ද? මනස ප්‍රධාන බව බුදුන් වහන්සේ දේශනා කර ඇත්තේ මනස සත්‍යය ලෙස ගැනීමට නොවේ. අපේ සියළු කටයුතුවල දී ප්‍රධාන වන්නේ මනස ය. මනස නැත්නම් අප හුදු යන්ත්‍ර බවට පත්වෙයි. එහෙත් මනස ප්‍රධාන යැයි ගත්විට එයින් මනස ඇතැයි යන්න හෝ මනස යනු සත්‍යයක් ය යන්න හෝ ගම්‍ය නොවේ. මනස ද නිර්මාණයකි. මනස මනසෙහි නිර්මාණයකි. පටිච්ච සමුප්පාදයෙහි විස්තර කෙරෙන්නේ මනස ඇතිවන ආකාරය, නැත්නම් මනස නිර්මාණය වන ආකාරය යැයි සිතිය හැකි ය. නැති මනස ඇතැයි ගැනීම සියළු ප්‍රශ්නවලට මුල වෙයි. ඒ අරුතින් ද මනස ප්‍රධාන වෙයි.

ප්‍රත්‍යක්‍ෂ සත්‍ය නොවුව ද අපට ප්‍රත්‍යක්‍ෂ මගහැරිය හැකි නොවේ. බුදුන්වහන්සේ ප්‍රත්‍යක්‍ෂයෙන් යම් යම් දේ දැනගැනීමට දේශනා කෙළේ ඒ සත්‍ය නිසා නොව මනස සම්බන්ධයෙන් දැනගැනීමට වෙනත් දෙයක් නොකළ හැකි නිසා යැයි සිතමි. නැති මනස නැති මනසක් බව "දැනගැනීමට" වුව ද මනස ඔස්සේ ම යා යුතු වෙයි. ප්‍රත්‍යක්‍ෂ සත්‍ය නොවී තිබිය දී ප්‍රත්‍යක්‍ෂ ආධාර කරගත හැකි අන්දමට ම වියුක්ත ප්‍රවාද ද සත්‍ය නොවී තිබිය දී ඒ ආධාර කරගැනීමට අපට හැකි විය යුතු ය. අප අපේ ප්‍රවාද ගොඩනගන්නේත් ඒ ආධාර කරගන්නේත් බුදු දහම එලෙස තබා ගනිමින් බුදු දහම ප්‍රත්‍යක්‍ෂ සම්බන්ධයෙන් දරණ ආකල්පය වටහාගනිමිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva